# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

## පුරප්පාඩු - ව්‍යාපෘති කාර්ය මණ්ඩලය

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය අනුරාධපුරයේ නාගරික යටිතල පහසුකම්, සේවා, සංචලනය, ගමනාගමන සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම, පොදු නාගරික අවකාශයන් වැඩිදියුණු කිරීම සහ ව්‍යාපෘතියේ ආයෝජනය හරහා වර්ධනය වූ වත්කම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට පාර්ශ්වකරුවන්ට හැකි වන පරිදි ඔවුන්ගේ ආයතනික ධාරිතා සංවර්ධනය යන අරමුණු ඇතිව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද නාගරික සංවර්ධන ප්‍රයත්නයකි. නගරය/නගර කලාපයේ විශේෂිත සංස්කෘතික හා ආර්ථික වත්කම් උපයෝගී කරගනිමින් උපායමාර්ගික ආයෝජන හරහා නගරය තුළ පරිවර්තනයන් ඇති කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. ව්‍යාපෘතිය සඳහා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (AFD) සහයෝගය දක්වයි.

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහත තනතුර පිරවීම සඳහා සුදුසුකම් ලත් පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය, රජයේ රෙගුලාසි පිළිබඳ හොඳින් දැනුවත්ව සිටීම සහ පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතා වේ.

| අනු අංකය | තනතුරු නාමය | අංකය | අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද |
|---|---|---|---|
| 01 | **කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව මට්ටම PS - 1** | | |
| | **ව්‍යාපෘති අධ්‍යක්ෂ** | **01** | (පහත 1 හෝ 2 හෝ 3)<br>1) අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>**හෝ**<br>අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ ප්‍රථම උපාධියකට සමාන සුදුසුකමක් බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්<br>**හෝ**<br>ආශ්‍රිත සාමාජිකත්වය / අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තීය ආයතනයක ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්<br>**සහ**<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 16ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, ඉන් වසර 8 ක කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සේවා කාලයක් සහිත විය යුතුය.<br><br>2) අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>**හෝ**<br>අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ ප්‍රථම උපාධියකට සමාන සුදුසුකමක් බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්<br>**හෝ**<br>ආශ්‍රිත සාමාජිකත්වය / අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තීය ආයතනයක ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්<br>**සහ**<br>පූර්ණ / වරලත් සාමාජිකත්වය හෝ අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තීයමය ආයතනයක ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් ලබාතිබීම හෝ අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබාගත් පශ්චාත් උපාධියක්<br>**සමග**<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 14 ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, ඉන් වසර 7 ක කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br><br>3) අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>**හෝ**<br>අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ ප්‍රථම උපාධියකට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්<br>**සහ**<br>අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබාගත් පශ්චාත් උපාධියක්<br>**සමග**<br>පූර්ණ/ වරලත් සාමාජිකත්වය හෝ අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තීයමය ආයතනයක ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්<br>**සමග**<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, ඉන් වසර 6 ක කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සේවා කාලයක් සහිත විය යුතුය. |

**නියමයන් සහ කොන්දේසි :**

වැටුප්, නියමයන් සහ කොන්දේසි 2019.03.15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 පරිදි වේ.

**අයදුම්පත්‍රය යොමු කිරීම :**

කැමැත්තක් දක්වන අයදුම්කරුවන් සුදුසුකම් (පරිගණක සාක්ෂරතාව සහ ඉංග්‍රීසි හා අදාල සුදුසුකම් ඇතුළත්ව), පළපුරුද්ද සහ දුරකථන අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළත් වෙනත් අදාල තොරතුරු සඳහන් කරමින් ඔවුන්ගේ අයදුම්පත් 2022.04.06 දින හෝ ඉන් පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. රාජ්‍ය ආයතනවල අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා යොමු කළ යුතුය.

**ලේකම්,**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,**
**08 වන මහල, "සුහුරුපාය",**
**බත්තරමුල්ල.**